**ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව.**
**--------------------------------------**
**මාතලේ දිස්ත්‍රික්කය.**
**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය
------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු.17,400 ක වියදම් හා ඉකුත් වර්ෂයේ දී දරා තිබුණු රු.367,500 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) තොග ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති රු.154,610 ක් වටිනා තොග මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී ලැබී තිබුණු යතුරුපැදි දෙකක වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජංගම ගිණුම් අංක 122-1-001-1-0000127 ට අදාළ රු.114,850 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු වලින් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ මිලදී ගන්නා ලද රු.75,743 ක් වටිනා පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් වශයෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් ලැබුණු රු.38,430 ක් වර්ෂයේ ආදායමට නොගෙන ලැබිය යුතු ආදායමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ස්ථිර කර තිබූ සේවකයන්ගේ වැටුප් ලෙස ප්‍රතිපූර්ණය විය යුතු රු.276,000 ක් පියවිය යුතු අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.294,058 ක අවසන් තොගය ගණනය කර තිබුණේ වර්ෂයේ ආරම්භක ශේෂයට ජල උපකරණ මිලදී ගැනුම් පමණක් එකතු කර, වර්ෂය තුළ නිකුත් කිරීම් අඩු නොකර බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතැති තොගය නිවැරදි නොවුණි.

(ඒ) වර්ෂය තුළ ලැබී තිබුණු ජල සම්බන්ධතා ගාස්තුව රු.62,000 ක් වුවත් රු.116,200 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් රු.54,200 ක් වැඩියෙන් දැක්වුණි.

(ඔ) දීර්ඝ කාලයක් තිස්සේ බැංකු සැසඳුමේ ඉදිරියට ගෙන එනු ලබන වැඩියෙන් ගෙවූ රු.13,069ක මුදල නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.26,166,163 ක් වූ ගිණුම් විෂයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.2,167,054 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------

ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු අවිනිශ්චිත ගිණුමේ වූ රු. 1,839,420 ක බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට ද එලෙසම දක්නට ලැබුණු අතර, එම ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.694,803 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක වටිනාකම රු.2,752,055 ක් වූ අතර, දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින මෙම ශේෂ සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයන් 08 කට අදාළ එකතුව රු.8,203,868 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛයනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 ජූලි 14 දිනැති අංක 04/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රක්ෂණ පහසුකම් ලබාගැනීමේදී මිල ගණන් කැඳවා සෘජුවම රක්ෂණ පහසුකම් ලබා ගත යුතු වුවත් මිල කැඳවීමකින් තොරව රක්ෂණ නියෝජිතයින් මඟින් අවස්ථා 09 කදී රු. 248,140 ක මුදලකට රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. |
| (ආ) | 2015 මැයි 22 දිනැති අංක PL/7/3 දරන පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය. | සභාවේ මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කළ රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු තම නිත්‍ය රාජකාරී ස්ථානවලින් සහනදායී ක්‍රමය මත යතුරුපැදි ලබාගෙන තිබියදී, සභාවේ මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කරමින් පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශයෙන් ද යතුරු පැදි ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු 3,031,210 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම 2,580,853 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු 450,357 ක වර්ධනයක් විය.

2.2 ආදායම් පරිපාලනය

---------------------

2.2.1 බදු කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.132,410 ක් වූ හිඟ ශේෂයන් වර්ෂය තුළ රු.43,900 ක් පමණක් අයකරගෙන තිබුණු අතර එය මුළු හිඟයෙන් 33% ක අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ බදු කුලී ශේෂය රු.89,630 ක් වූ අතර එයට වසරකට වඩා වැඩි රු.88,510 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍ර සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණු බැවින් බිල්කළ ආදායම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.2.3 අක්කර බදු

-----------

වසර 05 කට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින හිඟහිටි අක්කර බදු ශේෂය රු.60,368ක් වූ අතර එම ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවරගෙන නොතිබුණි.

2.2.4 ජල ගාස්තු

-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.405,006 ක් වූ අතර එහි වසරකට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.272,887 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.738,734 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.704,946 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**2.2.6 දැන්වීම් පුවරු ගාස්තු**

**----------------------**

ප්‍රචාරන දැන්වීම් පුවරුවලින් ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු බැවින් සභා බල ප්‍රදේශයේ විවිධ වෙළඳ ආයතනවල හා ස්ථානවල ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරණ දැන්වීම් පුවරුවලින් ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 18 දිනැති අංක 25/2014 චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර කරන ලද අනුමත කාර්ය මණ්ඩලය ඉක්ම වූ නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ස්ථිර කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය නොවීම මත මාසිකව රු.240,396 ක මුදලක් සභා අරමුදලින් දැරීමට සිදුවී තිබුණි.

(ආ) සභාවේ තනතුරු 06 කට අදාළ පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පිටතට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගේ එකතුව රු.394,892 ක් වූ ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති දෙකක කම්කරුවන්ට චෙක්රෝල් මගින් රු.23,500 ක වැටුප් ගෙවා තිබුණද වැටුප් ලබා ගත් බවට අදාළ පුද්ගලයන්ගේ අත්සන් ලබාගෙන නොතිබුණි.

3.2 හඳුනාගත් අලාභ

--------------------

නියෝජිතයෙක් මාර්ගයෙන් සභාව සතු දේපළ රක්ෂණය කිරීම හේතුවෙන් සභාවට ලබාගත හැකිව තිබූ රු.24,814 ක වට්ටම් මුදලක් අහිමි වී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අංක 96, මොරතැන්න පදිංචි දමිත් අනුරුද්ධ යන අයගේ නිවස සඳහා රු.24,920 ක වියදමින් අඩි 10 සෙවිළි තහඩු 56 ක් ලබාදී තිබූ නමුත්, සෙවිලි කර තිබුණේ තහඩු 34ක් පමණක් බැවින් ඉතිරි තහඩු 22 සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(ආ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ දාස්ගිරිය අංක 107 හි පිහිටි පෞද්ගලික අමුණක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව රු.25,000 ක වියදමින් සිමෙන්ති, මැටල්, වැලි හා ගල් අදාළ පුද්ගලයා වෙත ලබා දී තිබුණි.

(ඇ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ශාසනරත්න පිරිවෙනෙ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව 2015 අගෝස්තු 06 දින රු.50,000 ක වියදමින් ඇස්බැස්ටෝස් තහඩු ලබාදී තිබුණු අතර,2015 නොවැම්බර් 19 දින වන විටද තහඩු සෙවිළි කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමක් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාවට රු.10,000,000 ක ප්‍රතිපාදන ලැබී ඉලුක්කුඹුර ජල ව්‍යාපෘතිය අළුත්වැඩියාව, කහගල ජල ව්‍යාපෘතිය අළුත්වැඩියාව, රත්කින්ද සිට මැදඇල මාර්ගය සංවර්ධනය සහ හත්තොට අමුණ උපකාර්යාලය, ගුරුවෙල හා ඉලුක්කුඹුර පුස්තකාල අළුත්වැඩියා සිදුකිරීමට යෝජිතව තිබුණි. මෙම ව්‍යාපෘතිවල ඉටු කළයුතු වැඩ කොටස් හඳුනාගෙන ඇස්තමේන්තු ගත ද්‍රව්‍ය හා ශ්‍රම විශ්ලේෂණ වාර්තා සකස් කර නොතිබුණ අතර, ව්‍යාපෘති නිමවූ පසු ද්‍රව්‍ය, ශ්‍රමය හා ඉන්ධන ඇතුළත් වාර්තා පමණක් සකස් කර තිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රත්කින්ද සිට මැද ඇලගම දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවේ වියදම හා සත්‍ය වියදම අතර රු.216,662ක් හෙවත් 40% ක අඩුවීමක් තිබුණි.

(ඊ) ලග්ගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුලී රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණද, ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ව්‍යාපෘති යටතේ ඉදිකළ කර්මාන්ත වලට අදාළ නාම පුවරු කර්මාන්තයේ ඇස්තමේන්තුවටම ඇතුළත් කර ඉටුකරවා ගතයුතු වුවද,

නාමපුවරු සවිකිරීම සඳහා සමිතියකට කොන්ත්‍රාත් ලබාදී, නාම පුවරු සවිකළ බවට කිසිදු පරික්ෂාවකින් තොරව රු.258,700 ක් ගෙවීම් කර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(i) පිළිවෙලින් රු.250,000ක් හා රු.85,000ක් වටිනාවිදුලි ජනක යන්ත්‍රය හා බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව සභා පරිශ්‍රයේ දමා තිබුණි.

(ii) අංක 49-1968 දරන කුබෝටා ට්‍රැක්ටරය 2014 වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම.

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 ජනවාරි මාසයේදී සිදුකර තිබූ නමුත්, සභා පරිශ්‍රයේ තිබූ රු.133,075 ක් වටිනාකම වූ ජලනල හා ඉදිකිරීම් ද්‍රව්‍ය තොගයක් මෙම සමීක්ෂණයෙන් අත්හැර ඇති බව 2016 මැයි 02 දින විගණන පරික්ෂාවේදී අනාවරණය විය.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

4.1 අයවැය පාලනය

ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදගෙන නොතිබුණු බව නිරීක්ෂණ විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 16 ක් සඳහා ඇතිකළ රු.201,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) අය විෂයයන් 07 ක් සඳහාරු.204,500 ක ආදායම් ඇස්තමේන්තු කළද කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය ගබඩා පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ණයගැති හා ණයහිමි පාලනය
(උ) ගබඩා පාලනය